පූජ්‍ය ඉලුකේවෙල ධම්මරතන හිමි
ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, දර්ශනපති
බෞද්ධ දර්ශනය අධ්‍යයනාංශය
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

**ථෙරවාද අභිධර්ම පිටකයේ සංවර්ධනය**

බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව සිදු වූ තුන්වන ධර්ම සංගායනාවෙන් පසු අභිධර්මය පිළිබඳ ව සුවිශේෂී අවධානයක් යොමු වී ඇති බව පෙනේ. විශේෂයෙන් අශෝක රජුයේ රාජ්‍ය අනුග්‍රහයෙන් සංවර්ධනය වූ ථෙරවාද සම්ප්‍රදාය තුළත් ක්‍රි. පූ. දෙවන සියවසේ දී පමණ කණිෂ්ක රජුගේ රාජ්‍ය අනුග්‍රහයෙන් භාරතයෙහි මථුරා ප්‍රදේශයෙහි ස්ථාපිතව පසුව කාෂ්මීරය දක්වා ව්‍යාප්ත වූ සර්වාස්තිවාද සම්ප්‍රදාය තුළත් අභිධර්ම පිටකයක් දක්නට ලැබීම ඒ පිළිබඳ සිදුකෙරන අධ්‍යයන කාර්යයන්හි සාඵල්‍යට හේතු වෙයි. එසේ නොවන්නට අභිධර්ම පිටකය ථෙරවාද සම්ප්‍රදායෙන් ඉවත් කිරීමට ද ඇතැම් විට හැකිවනු ඇත. සර්වාස්තිවාද සම්ප්‍රදාය අභිධර්ම පිටකය බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීමුඛ දේශනාවක් කොට නොපිළිගත්ත ද එහි ගෞරවය බුදුරජාණන් වහන්සේ වෙත පවරා ඒ ඒ ග්‍රන්ථයන්හි කර්තෘත්වය ශ්‍රාවක සංඝයා වෙත පවරාගනී. එසේ සකස්කරන ලද සර්වාස්තිවාද සම්ප්‍රදායට අයත් අභිධර්ම පිටකය එක් මූල ග්‍රන්ථයකින් හා පාද ග්‍රන්ථ හයකින් සමන්විත ය. යශෝමිත්‍ර විසින් අභිධර්මකෝශභාෂ්‍යයට සම්පදනය කරන ලද ස්ඵුටාර්ථ අභිධර්මකෝශව්‍යාඛ්‍යා වෙහි ඥානප්‍රස්ථාන නම් ග්‍රන්ථය 'මූලය' ලෙසත් අනෙක් ග්‍රන්ථ 'පාද' ලෙසත් හඳුන්වා ඇත.

1. ඥානප්‍රස්ථාන - ආර්ය කාත්‍යායනීපුත්‍ර
2. ප්‍රකරණපාද - ස්ථවිර වසුමිත්‍ර
3. විඥානකාය - ස්ථවිර දේවශර්මන්
4. ධර්මස්කන්ධ - ආර්ය ශාරිපුත්‍ර
5. ප්‍රඥප්තිශාස්ත්‍ර - ආර්ය මෞද්ගල්‍යායන
6. ධාතුකාය - පුරාණ
7. සංගීතිපර්යාය - මහාකෞෂ්ඨිල

සංස්කෘත සහ ටිබෙට් මූලාශ්‍රයට අනුව මෙම ග්‍රන්ථයන්හි කර්තෘත්වය ඉහත දක්වා ඇති පරිදි වේ. එහෙත් චීන පරිවර්තනයන්හි කර්තෘවරුන්ගේ ඇතැම් වෙනස් කම් දක්නට ලැබේ.

අභිධර්ම පිටකයේ කර්තෘත්වය බුදුරජාණන් වහන්සේ වෙත ම පවරන ථෙරවාද සම්ප්‍රදාය එහි ප්‍රභවය තාවතිංස දේව ලෝකයේ දී සිදු වූ බව පෙන්වා දෙයි. මාතෘ දිව්‍ය රාජයා ඇතුළු දෙවියන් අරභයා අභිධර්ම දේශනාව බුදුරජාණන් වහන්සේ විසින් සිදු කළ බවත් එහි දී නිර්මිත බුද්ධ රූපයක් මවා උන්වහන්සේ මිනිස් ලොවට වැඩම කළ බවත් දන් වළඳා අවසානයේ දී එහි සාරාංශයක් සැරියුත් මහරහතන් වහන්සේට දේශනා කළ බවත් අත්ථසාලිනියෙහි සඳහන් වේ.[1] ඉන් අනතුරුව සැරියුත් හිමියන් උන්වහන්සේගේ පන්සියයක් වූ ශිෂ්‍ය භික්ෂූන් වෙත එම අභිධර්මය විස්තරාත්මකව ඉගැන් වූ බවත් ඉන් පසු ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවෙන් පැමිණ තෙවන

ධර්මසංගායනාව සිදුවන සමයේ දී රේවත හිමියන් උගත් බවත් දක්වේ. බුද්ධ පරිනිර්වාණයෙන් වසර 235කට පසුව එනම් ක්‍රි. පූ. 251 දී පාටලීපුත්‍රයෙහි පවත්වන ලද තුන්වන ධර්ම සංඝායනාවේ දී රේවත හිමියන් විසින් එකී අභිධර්මය දේශනා කරන ලද බවත් පෙන්වා දෙයි.

මෙලෙස පැමිණි ථෙරවාද සම්ප්‍රදායට අයත් අභිධර්ම පිටකයෙහි ප්‍රකරණ නාමයෙන් ගැනෙන මූලික ග්‍රන්ථ ගණන හතකි.

1. ධම්මසංගිණී
2. විභංග
3. ධාතුකථා
4. පුග්ගලපඤ්ඤත්ති
5. කථාවත්ථු
6. යමක
7. පට්ඨාන

මෙම ප්‍රකරණ ග්‍රන්ථයන්හි ක්‍රමික සංවර්ධනය පෙන්වා දෙන ලා වැලී පෝසින් (La Vallee Poussing) මෙහි පළමු ග්‍රන්ථ දෙක මුල් යුගයටත් අනෙක් ග්‍රන්ථ පහ පසුකාලීන යුගයටත් අයත් බව පෙන්වා දෙයි.[2] ඒ අනුව මෙම ග්‍රන්ථ එක ම අවස්ථාවක දී සම්පාදන වූ ග්‍රන්ථ නොවන බවත් ක්‍රමයෙන් පම්පාදනය වූ ග්‍රන්ථ බවත් එතුමා තහවුරු කරයි. තුන්වන ධර්ම සංගායනාවෙන් අනතුරුව එනම් ක්‍රි. පූ. 3වන සියවසෙන් පසු ශ්‍රී ලංකාවට බුදුදහම පැමිණීමත් සමග ථෙරවාද අභිධර්මයෙහි සීඝ්‍ර සංවර්ධනක් සිදු ව ඇත. ඒ අනුව අභිධර්ම සාහිත්‍යයේ සිදු වූ ක්‍රමික සංවර්ධනය පියවර තුනක් ඔස්සේ ඉදිරිපත් කොට ඇත.

1. අභිධර්ම ප්‍රකරණ ග්‍රන්ථ හා පරිවාර ග්‍රන්ථ සම්පාදනය
2. අටුවා සම්පාදනය
3. මූලටීකා සහ අනුටීකා සම්පාදනය

අභිධර්මය බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීමුඛ දේශනාවක් නොවූව ද එය බුද්ධ දේශනයක් යැයි පිළිගැනීම සඳහා ප්‍රමාණවත් සාධක පෙළ දහමින් හමුවෙයි.

1. බුදුරජාණන් වහන්සේ විසින් තබන ලද මාතෘකාවකට වෙනත් ශ්‍රාවකයෙකු විසින් කරන ලද දේශනාවක් සඳහා බුදුරජාණන් වහන්සේගේ අනුමැතිය ලැබීම.

2. ශ්‍රාවයන් වහන්සේ නමක් වෙනත් තැනකදී පැවැත්වූ දේශනයක් සඳහා බුදුරජාණන් වහන්සේගේ අනුමැතිය ලැබීම.

3. යමෙකු විසින් බුදුරජාණන් වහන්සේගෙන් අසනු ලබන ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම සඳහා ඊට සුදුසු වෙනත් ශ්‍රාවකයෙකු වෙත යොමු කිරීම හා ඒ සඳහා ලබා දුන් පිළිතුර සඳහා බුදුරජාණන් වහන්සේගේ අනුමැතිය ලැබීම.

4. බුදුරජාණන් වහන්සේ විසින් අඩක් පවත්වන ලද දේශනාවක ඉතිරි කොටස නිම කිරීම සඳහා වෙනත් ශ්‍රාවකයෙකු යොමු කිරීම හා ඒ සඳහා බුදුරජාණන් වහන්සේගේ අනුමැතිය ලැබීම.

උක්ත කරුණු වෙත අවධානය යොමු කරන අටුවාචාරීන් වහන්සේ එවැනි දේශනා බුද්ධ වචනය ලෙස පිළිගතයුතු බව පෙන්වා දෙයි. විශේෂයෙන් මහාපරිනිබ්බාණ සූත්‍රයේ දී සතර මහාපදේස කවරේ දැයි හඳුන්වා දෙන බුදුරජාණන් වහන්සේ ඉන් අනතුරු ව ඒ පිළිබඳව කටයුතු කළ යුත්තේ කෙසේ දැයි උන්වහන්සේ විසින් පැහැදිලි කරන ලදි.

මහාපදේස යනු ධර්මය ශාවකයා හෙවත් අනුගාමිකයා වෙත සමීපවන ක්‍රම හතරකි. එලෙසින් ලැබෙන ධර්මය පිළිබඳව කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය විස්තර කිරීම සඳහා 'සුත්තෙ ඔතරන්ති විනයෙ සන්දිස්සන්ති' යන්න උන්වහන්සේ විසින් උපයෝගී කර ගන්නා ලදි. දීඝනිකායේ මහාපරිනිබ්බාණ සූත්‍රයේ ද අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ මහාපදේස සූත්‍රයේ ද මේ පිළිබඳ සාකච්ඡා කෙරෙයි. මීට අමතරව, අටුවාවෙහිද එමෙන් ම නෙත්තිප්පකරණයෙහි ද මේ පිළිබඳ ව කරුණු දක්වා ඇත.

මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි එන සතර මහාපදේස බුදුරජාණන් වහන්සේ භෝග නගරයෙහි ආනන්ද චේතිය නම් ස්ථානයේ දී ආනන්ද හිමියන් අරඹයා දේශනා කර ඇත.

> ''මහණෙනි, මේ ශාසනයෙහි යම් භික්ෂුවක්, ඇවැත්නි, ධර්මය මෙය යි, විනය මෙය යි, බුද්ධ ශාසනය මෙය යැයි බුදුරජාණන් වහන්සේ හමුවෙහි සිට තමන් විසින් අසන ලද්දේ ය, බුදුරජාණන් වහන්සේ හමුවෙහි දී පිළිගන්නා ලද්දේ යැයි ප්‍රකාශ කළ ද එපමණින් එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නොකළ යුතුය. එම භික්ෂුවගේ වචනය පිළිගැනීම ද ප්‍රතික්ෂේප කිරීම ද නොකොට එම ප්‍රකාශයෙහි පද ව්‍යංජන මැනවින් ඉගෙන සූත්‍රයෙහි බහාලිය යුතුය, විනයෙහි සැසඳිය යුතුය. ඉදින් සූත්‍රයෙහි බහාලන විට විනයෙහි සසඳන විට සූත්‍රයෙහි බහාලිය නොහැකි නම් විනයෙහි සැසඳිය නොහැකි නම් ඒකාන්තයෙන් එය බුදුරජාණන් වහනසේගේ වචනය යැයි වරදවා නොගත යුතුය. ඉදින් සූත්‍රයෙහි බහාලිය හැකි නම් විනයෙහි සැසඳිය හැකි නම් එය භාග්‍යවතුන් වහන්සේගේ වචනය යැයි ගත යුතුය.''[3]

මේ අයුරින් ධර්මය ව්‍යාප්ත වන ක්‍රම හතරක් හතරක් මහාපදේස නමින් මහාපරිනිබ්බාණ සූත්‍රයෙහි පෙන්වා දෙයි.

1. **බුද්ධාපදේස** - මෙය බුදුරජාණන් වහන්සේගෙන් අසන ලදි.[4]
2. **සංඝාපදේස** - මෙය මහා සංඝයාගෙන් අසන ලදි.[5]
3. **මහාථෙරාපදේස** - මෙය එක් ආවාසයක වසන බොහෝ තෙරුන්ගෙන් අසන ලදි.[6]
4. **ඒකථෙරාපදේස** - මෙය එක් ථෙරකගෙන් අසන ලදි.[7]

මහාචාර්ය ඔලිවර් අබේනායක මහතා මෙහි එන 'සුත්තෙ ඔතරන්ති විනයෙ සන්දිස්සන්ති' යන්න විග්‍රහ කරමින් 'සුත්තෙ' යන්නෙන් 'සූත්‍ර' යන්න ගත නොහැකි බව පෙන්වා දෙයි. එයට හේතුව

වශයෙන් එතුමා දක්වන්නේ සුත්තේ ඔතාරෙතබ්බානි යන පාඨය බුදුරජාණන් වහන්සේගේ දේශනා පාඨයක් වීමත් එය ත්‍රිපිටකය සංගායනා වීමට ප්‍රථම සිදුකරන ලද්දක් වූවක් වීමත් ය. එසේ හෙයින් සුත්තෙ යන්නෙන් සූත්‍ර පිටකය ගත නොහැකිය. එබැවින්, නෙත්තිප්පකරණයෙහි මේ පිළිබඳව ඉදිරිපත් කරන කරුණු විමසා බැලිය යුතුය. එහි 'සුත්තෙ ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙ තබ්බානි' යන්න විග්‍රහ වී ඇත්තේ මෙසේ ය.

කතස්මිං සුත්තෙ ඔතාරයිතබ්බානි? චතුසු අරියසච්චේසු.
කතමස්මිං විනයෙ සන්දස්සයිතබ්බානි? රාගවිනයෙ, දොසවිනයෙ, මොහවිනයෙ.

මේ අනුව සුත්තෙ ඔතරන්ති විනයෙ සන්දිස්සන්ති යන්නට වඩාත් උචිත වන්නේ නෙත්තිප්පකරණයෙහි දක්නට ඇති අර්ථවිවරණය යි. එනම් 'සූත්‍ර යනු චතුරාර්ය සත්‍යයි. විනය යනු රාගවිනය, දොසවිනය හා මෝහවිනය යි'. බව මහාචාර්ය ඔලිවර් අබ්නායක මතහා පෙන්වා දෙයි. එබැවින් සූත්‍ර දේශනාවන්හිද හමුවන ශ්‍රාවක භාෂිත බුද්ධ භාෂිත ලෙස ගැනීමෙහි කිසිදු වරදක් න්‍යායාත්මක ව ද නොමැති බව තහවුරු වෙයි. මෙහි දී අපගේ අවධානය යොමු වන්නේ අභිධම්ම නමින් සිදු වී ඇති දේශනා පිළිබඳව යි.

මහාගෝසිඞ්ග සූත්‍රයෙහි සැරියුත් හිමියන් හා මහාමොග්ගල්ලාන හිමියන් අතර ඇතිවන සංවාදයක් දැක්වෙයි. එය අභිධර්ම කථාවක් ලෙස එහි සඳහන් කර ඇත.

> ඇවැත් ශාරිපුත්‍රයෙනි, මේ ශාසනයෙහි භික්ෂූහු දෙදෙනෙක් අභිධර්ම කථා කෙරෙත්. ඔහු ඔවුනොවුන් ප්‍රශ්න අසත්. ඔවුනොවුන් විසින් ප්‍රශ්න අසන ලද්දාහු විසඳත්. ඔහු ඔවුනොවුන් ප්‍රශ්න අසත්. ඔවුනොවුන් ප්‍රශ්න අසන ලද්දාහු විසඳත්.[8]

වනගත වූ භික්ෂුව වැඩි දුරටත් ධර්මය සහ විනය පිළිබඳ අධ්‍යයනයන්හි නියැලිය යුතු බව පෙන්වා දෙන අවස්ථාවක් ම.නි. කින්ති සූත්‍රයෙහි සඳහන් වෙයි. මෙහි එන 'අභිධම්ම' යන්න සත්තිස්බෝධිපාක්ෂික ධර්ම දැක්වීම සඳහා යොදන ලද්දක් බව එම සූත්‍ර විග්‍රහයෙන් තහවුරු වෙයි.

> ඇවැත්නි, ආරණ්‍යයක මහණහු විසින් අභිධර්මපිටකයෙහි ද විනයපිටකයෙහි ද පෙළ විසින් අටුවා විසින් යෝග කටයුතු ය. ඇවැත්නි, ආරණ්‍යයක මහණහු අභිධර්මයෙහි අභිවිනයෙහි පැන පුළුවුස්නාහු ඇත. ඉදින් ඇවැත්නි, ආරණ්‍යයක මහණ අභිධර්මයෙහි අභිවිනයෙහි පැන පුළුවුස්නා ලදුයේ සම්පාදනය කොට නො කියහෙයි ද, එකල්හි ඔහුට නුගුණ කියන්නාහු වෙති. ... එහෙයින් ආරණ්‍යයක මහණහු විසින් අභිධර්මයෙහි අභිවිනයෙහි යෝග කටයුත්තේ යැ.[9]

එමෙන් ම ධර්මය පිළිබඳ භික්ෂූන් අතර විවිධ මති මතාන්තර ඇත් නම් ඒවා වෙනත් බොහෝ භික්ෂූන් සමග සාකච්ඡා කොට නිරවුල් කරගත යුතු බව ද පෙන්වා දෙයි.[10] සමගි ව වාද විවාද නොකොට හික්මිය යුතු ආකාරය මෙහි දක්වා ඇත.

තවද මහණෙනි, සමග්‍ර ව සතුටු වෙමින් විවාද නො කෙරෙමින් හික්මෙන ඒ තොප අතුරෙන් භික්ෂූහු දෙදෙනෙක් ඒ අභිධර්මයෙහි නානාවාද ඇත්තාහු වෙති.[11]

යම් කරුණක් වැරදි ලෙස අර්ථ දක්වත් නම් එය ප්‍රතික්ෂේප කළ යුතු බවත් නිවැරදිව අර්ථ දක්වත් නම් එය පිළිගත යුතු බවත් එම සූත්‍රයෙහි දක්වා ඇත.

මෙසේ නපුරු කොට ගන්නා ලද්ද නපුරු කොට ගන්නා ලද හෙයින් ධැරිය යුතු ය. මනාකොට ගන්නා ලද්ද මනාකොට ගන්නා ලද හෙයින් ධැරිය යුතු ය. දුග්ගහීතය දුග්ගහීතය ලෙසින් ධරා සුග්ගහීතය සුග්ගහීතය හෙයින් ධරා යම් ධර්මයෙක් යම් විනයෙක් වේද, ඒ (ධර්මවිනය) කියයුත්තේ යි.[12]

එපමණක් ද නොව අභිධර්මයෙහි හික්මන්නට නොහැකි සාමණේර තෙම උපසම්පදාවෙහි නොපිහිටු විය යුතු බව මහාවග්ගපාලියෙහි දැක්වේ.

මහණෙනි, කරුණු පසකින් යුත් මහණහු විසින් උපසපන් නො කළ යුතු ය. නිස්සය නො දිය යුතු ය. සාමණෙර තෙමේ උපස්ථාන නො කළ යුතු ය. අතැවැසියා හෝ සද්ධිවිහාරිකයා හෝ සසුන් පිළිවෙතට සුදුසු ආචාරශික්ෂාවෙහි හික්මවන්නට, මාර්ගබ්‍රහ්මචර්යට ආදි වූ සිකපදයෙහි හික්මන්නට, අභිධර්මයෙහි හික්මවන්නට, සියළු විනයපිටකයෙහි හික්මවන්නට, උපන් මිසදිටු ධර්මානුකූලව තොර කරන්නට, පොහොසත් වූයේ නොවේ ද, ...[13]

ඉහත දක්වන්නට යෙදුණු සූත්‍රයන්හි එන 'අභිධම්ම' යන්න අයි.බී. හොනර් දක්වා ඇත්තේ ධර්මය පිළිබඳ වැඩිදුර විග්‍රහයක් ලෙසයි. "There are those who will question a monk who is forest-gone on Further Dhamma and Further Discipline."[14] එමෙන් ම 'අභිධම්මෙ විනෙතුං' හා 'අභිවිනයෙ විනෙතුං' යන්න දක්වා ඇත්තේ ධර්මයට අනුගත කිරීම හා විනයට අනුගත කිරීම යනුවෙනි.[15] රීස් ඩේවිඩ්ස් සහ ඕල්ඩන්බර්ග් 'අභිධම්මෙ විනෙතුං' 'අභිවිනයෙ විනෙතුං' යන්න පරිවර්තනය කර ඇත්තේ 'ධර්මයට අදාළව උපදෙස් දීම හා විනයට අදාළව උපදෙස් දීම' ලෙස යි.[16]

සූත්‍රයන්හි යෙදී ඇති අභිධම්ම යන්න පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ එය ධර්මය හා විනය පිළිබඳ සිදු කෙරෙන ගැඹුරු සාකච්ඡා බවයි.[17] ඒ බව ම.නි. මහාගෝසිඞ්ග සූත්‍රයෙන් ද දී.නි. සංගීති සූත්‍රයෙන් ද සනාථ වෙයි, 'අභිධම්මෙ අභිවිනයෙ උළාරපාමොජ්ජො', 'අභිධර්මයෙහි අභිවිනයෙහි බහුල ප්‍රමෝදය ඇත්තේ වෙයි.'.[18]

ඒ අනුව, බහුශ්‍රැත භික්ෂූන් අතර ධර්මය පිළිබඳ සිදු වූ ගැඹුරු සාකච්ඡා අභිධර්මය ලෙස සැලකිය හැකිය. එම සියලු ඉගැන්වීම් විධිමත්ව සම්පාදනය කොට 'අභිධර්මය' නමින් වෙනම පිටකයක් තුන්වන ධර්ම සංගායනාවේදී අනුමත වී ඇත. සූත්‍රාගත ඉගැන්වීම් මිනිසා තුළ පවත්නා ලෝභ හා දෝස මූලයන් ක්ෂය කොට මෝහයෙන් අතමිදීම සඳහා ය. විනය පිටකය වනාහි චර්යාත්මක ව මිනිසා තුල පවත්නා ලෝභ, දෝස හා මෝහ ඉවත් කෙරෙන්නකි. එහෙත් අභිධර්මය මනාහි

මෝහය නැති කොට එමගින් ඇතිවන්නා වූ ඥානයෙන් ලෝභය හා දෝසය නැති කිරීම සඳහා වන ධර්මය කි. එබැවින් සැදැහැවතුන්ගේ ධර්ම ඥානය වැඩි දියුණු කිරීම සඳහා මෙම ඉගැන්වීම් අතිශයින් ප්‍රයෝජනවත් වන හෙයින් ඔවුන්ගේ ශ්‍රද්ධාව තව දුරටත් වර්ධනය කිරීම සඳහා පිළිගත හැකි නිධාන කථා අටුවාචාරීන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද බව පෙන්වා දිය හැකිය.

---

[1] Attasālinī, vol. i, Maung Tin (tra.), PTS, pp. 18-20

[2] *Abhidharmakosabhasya*, vol. i, Leo M. Pruden (trans.), 1991, p. xlvii

[3] දී.නි. ii, 192 පිට

''සම්මුඛා මෙතං ආවුසො භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං, අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසනන්ති'' තස්ස භික්ඛවෙ භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං න පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති න විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: අද්ධා ඉදං න චෙව තස්ස භගවතො වචනං, ඉමස්ස ච භික්ඛුනො දුග්ගහිතන්ති. ඉති හෙතං භික්ඛවෙ ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං: 'අද්ධා ඉදං තස්ස භගවතො වචනංග. ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිත'න්ති.

[4] එම,

සම්මුඛා මෙතං භගවතො සුතං.

[5] එම,

තස්ස මෙ සංඝස්ස සම්මුඛා සුතං.

[6] එම,

තෙසං මෙ ථෙරානං සම්මුඛා සුතං.

[7] එම,

තස්ස ථෙරස්ස සම්මුඛා සුතං.

[8] ම.නි. i, බුජමු. 522 පිට

ඉධාවුසො සාරිපුත්ත ද්වෙ භික්ඛූ අභිධම්මකථං කථෙන්ති, තෙ අඤ්ඤමඤ්ඤං පඤ්හං පුච්ඡන්ති, අඤ්ඤමඤ්ඤස්ස පඤ්හං පුට්ඨා විස්සජ්ජෙන්ති නො ච සංසාදෙන්ති, ධම්මී ච නෙසං කථා පවත්තනී හොති.

[9] ම.නි. iii, බුජමු. 232 පිට

ආරඤ්ඤකෙන ආවුසො භික්ඛුනා අභිධම්මෙ අභිවිනයෙ යොගො කරණීයො. සන්තාවුසො ආරඤ්ඤකං භික්ඛුං අභිධම්මෙ අභිවිනයෙ පඤ්හං පුච්ඡිතාරො. සචෙ ආවුසො ආරඤ්ඤකො භික්ඛු අභිධම්මෙ අභිවිනයෙ පඤ්හං පුට්ඨො න සම්පායති, තස්ස භවන්ති වත්තාරො ... තස්මා ආරඤ්ඤකෙන භික්ඛුනා අභිධම්මෙ අභිවිනයෙ යොගො කරණීයො.

[10] I.B. Horner (trans.), Middle Length Sayings, iii, p. 25 (Qtd. *Abhidharmakosabhasya*, vol. i, Leo M. Pruden (trans.), 1991, p. xlvii-xxxvi)

But when you, monks, all together, in harmony and without contention have trained yourselves in these, there might be two monks speaking differently about Further-Dhamma.

[11] ම.නි. iii, බුජමු. 46 පිට

තෙසඤ්ච වො භික්ඛවෙ, සමග්ගානං සම්මොදමානානං අවිවදමානානං සික්ඛිතං, තත්‍ථ සියුං ද්වෙ භික්ඛු අභිධම්මෙ නානාවාදා.

[12] ම.නි. iii, බුජමු. 46 පිට

ඉති දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙතබ්බං සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙතබ්බං දුග්ගහිතං දුග්ගහිතතො ධාරෙත්‍වා සුග්ගහිතං සුග්ගහිතතො ධාරෙත්‍වා යො ධම්මො යො විනයො සො භාසිතබ්බො.

[13] මහාවග්ගපාලි, බුජමු, 160 පිට

අපරෙහිපි භික්ඛවෙ පඤ්චඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං. න නිස්සයො දාතබ්බො. න සාමණෙරො උපට්ඨාපෙතබ්බො, න පටිබලො හොති අන්තෙවාසිං වා සද්ධිවිහාරිං වා ආභිසමාචාරිකාය සික්ඛාය සික්ඛාපෙතුං, ආදිබ්‍රහ්මචරියිකාය සික්ඛාය විනෙතුං, අභිධම්මෙ විනෙතුං, අභිවිනයෙ විනෙතුං, උප්පන්නං දිට්ඨිගතං ධම්මතො විවෙචෙතුං, ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහඞ්ගෙහි සමන්නාගතෙන භික්ඛුනා න උපසම්පාදෙතබ්බං ...

[14] I.B. Horner (trans.), Middle Length Sayings, ii, p.145 (Qtd. *Abhidharmakosabhasya*, vol. i, Leo M. Pruden (trans.), 1991, p. xlvii-xxxvi)

[15] to lead him in what pertains to *dhamma*, to lead him what pertains to discipline

I.B. Horner, SBB XIV, p.84 (Qtd. *Abhidharmakosabhasya*, vol. i, Leo M. Pruden (trans.), 1991, p. xlvii-xxxvi)

[16] to instruct him in what pertains to the Dhamma, to instruct him in what pertains to the Dhamma (Vinaya).

Rhys-Davids and Oldenburg, SBE, XIII, pp. 184-5 (Qtd. *Abhidharmakosabhasya*, vol. i, Leo M. Pruden (trans.), 1991, p. xlvii-xxxvi)

[17] in the advanced teaching of both Doctrine and Discipline

T.W. and C.A.F. Rhys Davids, SBB, XC IV, p. 246 (Qtd. *Abhidharmakosabhasya*, vol. i, Leo M. Pruden (trans.), 1991, p. xlvii-xxxvi)

[18] දී.නි. iii, බුජමු. 458 පිට